MONEY
&
FINANCIAL INSTITUTIONS
(Part-IV)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

වාණිජ බැංකු

වාණිජ බැංකු සපයන ප්‍රධාන සේවාවන්

- තැන්පතු ආශ්‍රිත සේවා

- ණය ආශ්‍රිත සේවා

තැන්පතු ආශ්‍රිත සේවා

ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු), ඉතිරි කිරීමේ තැන්පතු හා ස්ථාවර තැන්පතු පවත්වා ගෙන යාම වාණිජ බැංකු විසින් පවත්වා ගෙන යන තැන්පතු ආශ්‍රිත සේවා වේ.

Class Work.LK

ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු)
(Current Accounts)

චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම් ඇති, ශේෂය මත පොළී හිමි නො වන ගිණුම් වර්ගයකි. බැංකු අයිරා පහසුකම් සැලසෙන අතර ටෙලර්පත් භාවිතයෙන් ගනුදෙනු කළ හැකි ය.

ඉතිරි කිරීමේ තැන්පතු (Savings Accounts)

ඉතිරි කිරීමේ පරමාර්ථයෙන් හඳුන්වා දී ඇති මෙම ගිණුම් වර්ගයට ශේෂය මත පොළියක් හිමි වේ. තැන්පත්කරුගේ අභිමතය පරිදි මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම කළ හැකි ය. ටෙලර්පත් මගින් ද ගනුදෙනු කළ හැකි ය.

ස්ථාවර තැන්පතුඃ (Fixed Deposits)

නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොළියක් යටතේ තැන්පත් කිරීමකි. ඉතිරිකිරීමේ තැන්පතුවලට සාපේක්ෂව ඉහළ පොළියක් හිමි වේ.

Classwork.LK

ජංගම ගිණුම් පවත්වා ගෙන යාමෙන් ව්‍යාපාරිකයන්ට ලබා ගත හැකි පහසුකම්

ඉහත තැන්පතු වර්ග අතුරෙන් ජංගම ගිණුම් පවත්වා ගෙන යාමෙන් ව්‍යාපාරිකයන්ට ලබා ගත හැකි පහසුකම් කිහිපයක් පහත දැක් වේ.

- චෙක්පත් මගින් ගෙවීම් කළ හැකි වීම
- ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකි වීම
- නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
- අයිරා පහසුකම් ලබා ගත හැකි වීම
- බැංකුව සමග කළ ගනුදෙනුවල වාර්තාවක් ලබා ගත හැකි වීම (බැංකු ගිණුම් ප්‍රකාශය)

ClassWork.LK

ණය ආශ්‍රිත සේවා

- අයිරා පහසුකම්
- ණය
    - ව්‍යාපාරික ණය
    - පාරිභෝගික ණය

ClassWork.LK

බැංකු අයිරා පහසුකම්

බැංකු අයිරා පහසුකම් යනු බැංකු ජංගම ගිණුමේ ඇති ශේෂය ඉක්මවා කිසියම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට වාණිජ බැංකු මගින් ලබා දෙන අනුමැතියකි.

මේවා තාවකාලික අයිරා පහසුකම් හා ස්ථාවර අයිරා පහසුකම් ලෙස වර්ග දෙකකි.

අයිරා පහසුකමක් දී ඇති විටක එම ප්‍රමාණය දක්වා ගනුදෙනුකරුවන්ගේ චෙක්පත් ගෙවීම බැංකු විසින් කරනු ලැබේ. එසේ ජංගම ගිණුම්හිමියා (ගනුදෙනුකරු) ජංගම ගිණුමේ ශේෂය ඉක්මවා නිකුත් කරන ලද චෙක්පත්වල වටිනාකම බැංකු අයිරාව ලෙස හැඳින්වේ. අයිරා සඳහා සාමාන්‍යයෙන් ඉහළ පොළියක් අය කෙරේ.

ClassWork.LK

ස්ථාවර අයිරා පහසුකම්

ස්ථාවර අයිරා පහසුකම් යනු අඛණ්ඩ ව කිසියම් අයිරා පහසුකමක් ලබා දීමයි. ස්ථාවර අයිරා ලබා ගැනීමේ දී වත්කම් ඇප තැබීම අවශ්‍ය වේ.

තාවකාලික අයිරා පහසුකම්

තාවකාලික අයිරා පහසුකම් යනු ස්ථාවර අයිරාවක් නො මැති ව ශේෂයට වඩා චෙක්පත් නිකුත් වී ඇති විට බැංකුව ඒ සඳහා මුදල් ගෙවීමයි.

ClassWork.LK

බැංකු ණය

බැංකු ණය යනු කිසියම් පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගන්නා ණය මුදල හා ඊට අදාළ පොළිය ආපසු ගෙවීමට යටත් ව ගිවිසගත් කොන්දේසි යටතේ බැංකුවක් විසින් දෙනු ලබන මුදලකි.

බැංකු ණය වර්ග

- ව්‍යාපාරික ණය
- පාරිභෝගික ණය

ව්‍යාපාරික ණය

ව්‍යාපාරික ණය යනු පුද්ගලයෙකුට හෝ ආයතනයකට තම ව්‍යාපාරික කටයුතු සඳහා කෙටි කාලීන ව, මධ්‍ය කාලීන ව හා දිගු කාලීන ව අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම වේ.

පාරිභෝගික ණය

පාරිභෝගික ණය යනු වත්කම් මිලට ගැනීමට හා හදිසි ආපදාවල දී පිරිමසා ගැනීමට පාරිභෝගිකයින්ට බැංකුව විසින් සපයන ණය වේ.

ClassWork.LK

- බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට ජංගම ගිණුමක් අත්‍යවශ්‍ය වන අතර බැංකු ණය ලබා ගැනීමට ජංගම ගිණුමක් අවශ්‍ය නො වේ.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති
(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura